ආරම්භය : 1945-09-30 ලි.ප. අංකය : කො 39/482
ධර්ම දානය පිණිස සෑම පුර පසළොස්වක් පොහෝ දිනයක් පාසා නිකුත් කරන
දෙහිවල බෞද්ධෝදය සංගමයේ මාසික ධර්ම පත්‍රිකාව

# බෞද්ධෝදය



68 වර්ෂය - ශ්‍රී. බු. ව. 2558 2014 අප්‍රේල් 14 බක් කලාපය

811 මාසික ධර්ම පත්‍රිකාව

# සසර සැපතට මුල්වන දානය !

**ගල්කිස්ස ශ්‍රී ධර්මපාලාරාමය සහ කතරගම උපාලි ධර්මාශ්‍රමාධිපති
ප්‍රවචන කීර්ති ශ්‍රී ශාසන ශෝභන ශ්‍රී සුමංගල විද්‍යාවතංස-මහෝපාධ්‍යාය
අග්ගමහා පණ්ඩිත අතිපූජ්‍ය කොටුගොඩ ධම්මාවාස අනුනායක
ස්වාමීන්ද්‍රයන් වහන්සේ විසිනි**

**නමෝ තස්ස භගවතෝ අරහතෝ සම්මාසම්බුද්ධස්ස**

**" අග්ගස්මිං දානං දදතං - අග්ග පුඤ්ඤං පවඩ්ඪති
අග්ගං ආයුං ච වණ්ණෝ ච - යසෝ කිත්ති සුඛං බලං. "**

**" අග්ගස්ස දාතා මේධාවී - අග්ගධම්මසමාහිතෝ
දේවභූතෝ මනුස්සෝ වා - අග්ගපත්තෝ පමොදති. "**

අංගුත්තර නිකාය, චතුක්ක නිපාත,
අග්ගප්පසාද සූත්‍රය.

ඉදිරි මාස කීපය තුළ දෙහිවල බෞද්ධෝදය සංගමයේ මාසික ධර්ම පත්‍රිකාවන් තුළින් සතර සංග්‍රහ වස්තු පිළිබඳව කරුණු පැහැදිලි කිරීමට බලාපොරොත්තු වනු ලැබේ. සතර සංග්‍රහ වස්තු යම් කෙනෙක් තුළ පිහිටියේ නම් ඒ පැවිද්දාට හෝ ගිහියාට සමාජයේ ඉහළ ම මට්ටමකට ගුණාත්මක වශයෙන් යා ගත හැකි ය. එබැවින් සතර සංග්‍රහ වස්තු පිළිබඳව අපේ සාමාන්‍ය ජනතාව තුළ මනා දැනීමක් ඇතිකරලීම බෙහෙවින් ම ප්‍රයෝජනවත් වන කරුණකි. සමාජයක් යහමගට යොමුකර ගැනීමට නම් ඔවුන් තුළ යහපත් ගති පැවතුම් ඇතිකර ගත යුතු ය. එවන් යහපත් ගුණ හිතට කාවැද්දවිය හැක්කේ සිත්ගන්නා සුළු අයුරින් උගන්වාලීමෙනි.එසේම වැඩිහිටි පිරිස ඊට අදාළ අයුරින් ජීවත් වුවහොත් පමණි. එනිසා සතර සංග්‍රහ වස්තූන්ගෙන් සුපෝෂිත වීමට බලාපොරොත්තු වන පුද්ගලයා දාන - ප්‍රිය වචන - අර්ථචරියා - සමානාත්මතා යන උදාර ගුණ හතරින් පරිපෝෂිත විය යුතු ය.

ඉතා උසස් අයුරින් අග්‍රස්ථානයෙහි ලා දන් දීම - පරිත්‍යාගය කරන පුද්ගලයාට එවන් අයුරින් ම උපනුපන් ආත්මවල දීර්ඝායු සම්පත්තිය රූප ශෝභාව, යසස නමින් හැඳින්වෙන වස්තුව සහ කීර්තිය, නිරෝගිතාවය ඇතුළු බලවත් පුද්ගලයෙක්ව ද උපත ලද හැකි වන්නේ ය.අපරිමිත ගුණ ඇතිව උදාර ගුණ පිහිටි මහා සංඝයාට කැප සරුප් දෙයින් දන් දුන් පුද්ගලයෝ දේවත්වයට පත් වුව ද, බ්‍රහ්මත්වයට පත් වුවද, මිනිසත් බව ලැබුව ද, දුකින් තොර - සම්පතින් යුතුව ම ජීවත් වන්නෝ ය. මේ දක්වන ලද්දේ ඉහත සඳහන් ගාථා දෙකේ අදහසයි. සතර සංග්‍රහ වස්තු ගැන කියවෙන තැන ප්‍රමුඛත්වයෙහි ලා සැලකෙන්නේ දානය යි- පරිත්‍යාගය යි.

මේ දානය ආහාර පාන දන්දීම් වශයෙන් ආමිස දාන ගණයට ද ප්‍රතිපත්ති දානය නමින් තම කාලයත් ශ්‍රමයත් වැයකොට ගුණාත්මක ගතිපැවතුම් වලින් තම ජීවිතය සරසාගත් විට එය සසර වසන තුරු සැප ලබාදෙන අමිල ආනිශංස දායී පුණ්‍ය ක්‍රියාවක් බවට ද පත්වන්නේ ය. පතන බෝධියකින් එතෙරවිය හැකි බුදු, පසේබුදු, මහරහත් බවට ද උපකාරවත් කරගත හැකි මේ ප්‍රතිපත්ති දානය මහානිශංසදායී කුසලයක් ද වන්නේ ය. දානය ගැන කියවෙන විට අප විසින් වැඩිපුර සලකනු ලබන්නේ ආහාර පාන - රෙදි පිළි - බේත් හේත් - ජල පහසුකම් - ඉඳුම් හිටුම් පිණිස නිවාස ස්ථාන ආදිය පරිත්‍යාග කිරීම ගැන ය. ඒහා සමාන ම තවත් ආනිශංසදායි දාන ගණනාවක් ඇත. ඒ පිළිබඳ අපගේ අවධානය වැඩි වශයෙන් යොමු නොවන නිසා ඊට අදාළ කරුණු තරමක්වත් පැහැදිලි කිරීම කළ යුතුව ඇත. ශ්‍රමදානය ද මීට ම යා කළ යුතු වැදගත් පරිත්‍යාගයකි. තම වෙහෙස මහන්සිය යොමු කොට පුණ්‍යවන්ත යහපත් ක්‍රියාවන්හි යෙදීම ශ්‍රමදානය යි.

ඒ ශ්‍රමදානමය පින අපේ පින්වතුන් නිතර සිදුකරනු ලබන කුසල ක්‍රියාවක් බව කවුරුත් දනිති. ළිඳක් කපා ගැනීමට-ගමකට ප්‍රයෝජනවත් වන කුඩා වැවක් සකස්කර ගැනීමට-නැතිබැරි කෙනෙකුට ගෙයක් දොරක් සදා දීමට - වෙහෙර විහාරස්ථානයක හෝ පාසලක - රෝහලක අවශ්‍ය කටයුත්තක් කරගැනීමට මිල මුදලකින් තොරව ඉදිරිපත් වීම ශ්‍රමදානමය පින්කමට අයත් ය.මෙබඳු ශ්‍රමදානමය පින්කම් අපේ ගම්වාසී නගරවාසී ජනතාව එකතුව සිදුකර ගන්නා බව නො රහසකි. තම අගනා කාලය දන්දීම ද පරිත්‍යාගයක් බව සැලකිය යුතු ය. අපේ සමාජයේ ජීවත් වන බොහෝ දෙනා සිතා නො බලා කටයුතු කිරීමේ ප්‍රතිවිපාකයක් වශයෙන් විවිධ කරදර කම්කටොලු වලට වැටෙති.භයානක ලෙස මානසික පීඩාවන්ට හසුවෙති.

එබඳු අවස්ථාවල දී වැඩිහිටි තෙරුන්වහන්සේලා - වැඩිහිටි ගුරුවරු - වැඩිහිටි තලතුනා අය හමු වී හෝ ඒ ඒ ප්‍රශ්න පිළිබඳව දැනුමක් ඇති අය මුණගැසී තම තමන්ගේ දුක් ගැනවිලි කියාපාති. එබඳු අවස්ථාවල දී ඒ දුක්ගැනවිලි කතාවලින් තමන්ට කිසිදු ප්‍රයෝජනයක් නැතත් - ඔහුගේ නැත්නම් ඇයගේ මනස සනසාලනු සඳහා තමන්ගේ වටිනා කාලය වැය කරමින් එයට ඇහුන් කන් දීම පිනකි. "ඔය කතාවලින් මට වැඩක් නෑ මට වැඩ කටයුතු තිබෙනවා. වෙන කාට හරි ඕවා ගිහින් කියන්න." යනුවෙන් අර මානසික පීඩනයට පත්වූ පුරුෂයා හෝ කාන්තාව එළවා ගැනීම හොඳ මදිය. ටික වෙලාවක් හෝ ගතකොට ඔහු හෝ ඇය සනසා යැවීම පිනක් වශයෙන් සලකා ඒ යුතුකම කළ යුතු ය.

ඉහත සඳහන් කළේ තම අගනා කාලය අන් අය වෙනුවෙන් ඇප කැප කිරීම කාලය දන්දීමක් වශයෙනි. බුදු බව පතා පින් දහම් කරන්නෝ තමා උපන් රට වෙනුවෙන්, තමන්ගේ සහෝදර ජනතාව වෙනුවෙන්, නැතිබැරි අය වෙනුවෙන්, පොදුවේගත් කලය ලෝකයා වෙනුවෙන් ම පුදුමාකාර ලැදි කමකින් යුතුව සේවය කරති. එය උතුම් දානයක් බව සැලකිය යුතු ය. තවද බුද්ධිමය දානය ද අතිවිශිෂ්ටතම දානමය පුණ්‍ය ක්‍රියාවක් බව සැලකිය යුතු ය. තමා ලබා ගත් ශිල්ප ශාස්ත්‍ර පිළිබඳ දැනුම - තව අයට ඉගැන්වීම - අන් අයට පුහුනු කිරීම වටිනා පින්කමකි. එසේ ම තමා දන්නා දේ විශේෂයෙන් බාල පරපුරට කියාදීම ඔවුන්ගේ බුද්ධිමත් බව පුළුල් කිරීමට උපකාරී වීම සසර වසනා තුරු විපාක දෙන පින්කමක් බව සැලකිය යුතු ය. පිරිවෙන් - පාඨශාලා - විද්‍යායතන ඇතිකරලීම පමණක් නොව - ග්‍රන්ථ කරණය - විශේෂයෙන් ම පුද්ගලයා යහමගට යොමු කරවන - ධර්ම ඥානය ලබාදීම ද - එසේ ම දහම්පාසල් අධ්‍යාපනය බඳු පරාර්ථ චාරිව සේවය කිරීම ද අගේකළ නො හැකි බුද්ධිමය දානයක් බව සැලකිය යුතු ය. ආචාර්ය වරයෙක් තමන් දන්නා ශබ්ද ශාස්ත්‍රය තමන් දන්නා භාෂා ශාස්ත්‍රය - ගණිත මිනිත - වෛද්‍ය කලා නක්‍ෂත්‍ර -කෘෂි කර්ම- වැවිලි-වඩු-ගෘහ-රන් රිදී කර්මාන්ත - මැටි කර්මාන්ත චිත්‍ර හා මූර්ති කර්මාන්තාදිය ලැදිකමකින් යුතුව අන් අයට ඉගැන්වීම ද බුද්ධිමය දානයට වැටෙන කුසල් බව කිව යුතුව තිබේ.

සිද්ධාර්ථ ගෞතම මහබෝසතාණන් වහන්සේ සෑම ආත්මභාවයකදී ම පදවි - තනතුරු - ඉඩකඩම් ගෙවල් දොරවල් රට රාජ්‍ය ආදී සියල්ල දන් දුන්නා සේම තම සසර පුණ්‍ය බලයෙන් ලද බුද්ධිමය දැනුම් සම්භාරය ද රාජ රාජ මහාමාත්‍යාදීන් - දිසාපාමොක් මහ ඇදුරුවරුන් - තවුසන් පැවිද්දන් වශයෙන් උපත ලද සෑම ආත්මභවයකදී ම අන් අයට කැපවීමෙන් යුතුව බෙදා හදා දුන් බව කොතෙකුත් තැන්හි ධර්මයෙහි සඳහන්ව ඇත. කවර දේශයක කවර තරාතිරමක පුද්ගලයෙක් ව කවර ජන කොටසක උපත ලැබුව ද, ඒ පිරිසට බෝසතුන්ගෙන් සිදු වූ සේවාව කියා නිමකළ නො හැකි තරම් ය. වංශවත් සුනඛ ආත්මයක උපත ලද මහා බෝසතාණෝ වහසි බස් දොඩන උපදේශකයන්ගේ අනුවන කථා නිසා තම සුනඛ වර්ගයා ඝාතනය කිරීමට රජු නියම කළ කල්හි රජුගේ සිංහාසනය යට ලැගගෙන සිට රජුට තම අදහස අඟවා සුනඛ වර්ගයා -

ඝාතනයෙන් වලක්වා ගත් අයුරු සඳහන් වන්නේ ය. සුනඛයෙක් වුව ද එදා තම බුද්ධියෙන් ගත් නිවැරදි ක්‍රියා පිළිවෙතෙහි ප්‍රථිඵලය එයයි. ඒ අනුව සියලු ම දානයන් අතර තැනට ඔබින නුවණින් යුතුව සිදුකරනු ලබන බුද්ධිමය දානය ද අතිවිශිෂ්ට වන්නේම ය.

මෙතෙක් සඳහන් කළේ දානය යන වචනයට අයත් වන විවිධාකාර දාන ක්‍රම පිළිබඳ කෙටි විස්තරයකි. ආමිෂ පූජා ප්‍රතිපත්ති පූජා  වශයෙන් දෙයාකාරව ද අභය දාන වශයෙන් අන් අයට මරණ භයක් ඇති නොවන පරිදි ක්‍රියා කිරීම ද උදාර පුණ්‍ය ක්‍රියාවක් වශයෙන් දක්වා තිබේ. තව කෙනෙකුට මොන ම කරුණක් නිසාවත් තම ජීවිතය පිළිබඳව වත්, තම මවු දෙමව්පියන් සහෝදර සහෝදරියන් පිළිබඳව වත් හානියක්, විපතක්, විනාශයක්, ඇතිවෙතැයි කිසිවෙකුටත් බියක් ඇති නො වන පරිදි තම ජීවිතය සකස්කර ගැනීම ද මේ සුවිශේෂ පරිත්‍යාගමය ප්‍රතිපදාවට අයත් බව සැලකිය යුතු ය. මෙකී කරුණු ගැන සලකා බලා දානය පිළිබඳව පුළුල් අවබෝධයක් ලබා ගැනීම බෞද්ධයන් වශයෙන් අප කාටත් අයිති යුතු කමකි. දානය පාරමිතාවක් වන අයුරු මීළඟ ධර්ම කලාපයේ දි සඳහන් කරන බව සැලකිය යුතු ය.